# මා විසින් කල හැකි හෝ නොහැකි දේ මොනවාද?

2012 යාවත්කාලීන කරන ලදී *Sinhalese*

මෙම පොත් පිංච මගින් විවෘත තැන්වල ගින්දර පත්තු කිරීම නීතියෙන් සීමාකර ඇතිවිට, Fire Danger Periods (ගිනි අනතුරු කාල) ලෙස සහ Total Fire Ban (සම්පූර්ණ ගිනි තහනම්) ලෙස ප්‍රකාශයට පත් කර ඇති දිනවලදී ඔබ විසින් කල හැකි සහ කල නොහැකි දේ පැහැදිලි කරදේ.

උණුසුම් දේශගුණය ආරම්භ වනවාත් සමගම CFA මගින් Fire Danger Periods (ගිනි අනතුරු කාල) ප්‍රකාශයට පත් කෙරේ. මැයි 1 වන දිනට පෙර අවලංගු කරනු ලැබුවහොත් හෝ වෙනස් කරනු ලැබුවහොත් මිස මෙම සීමා එදින දක්වා බලපැවැත්වේ. ප්‍රාන්ත වනාන්තර, ජාතික, ප්‍රාන්ත සහ ප්‍රාදේශීය උද්‍යාන සහ ආරක්‍ෂා කරන ලද මහජන ඉඩම් සම්බන්ධයෙන් මුළු වසර පුරාම ගින්දර පත්තු කිරීම සම්බන්ධ සීමා බලාත්මකවේ. මෙම ප්‍රදේශවල ගින්දර පත්තු කිරීම සම්බන්ධ සීමා සම්බන්ධ උපදෙස් සඳහා DSE සහ Parks Victoria කාර්යාල හා සම්බන්ධවන්න.

CFA මගින් Total Fire Bans (සම්පූර්ණ ගිනි තහනම්) ප්‍රකාශයට පත් කරනු ලබන්නේ ගින්දර සීඝ්‍රයෙන් පැතිරිය හැකි සහ පාලනය කිරීමට අපහසු විය හැකි දිනවලය. Fire Danger Periods (ගිනි අනතුරු කාල) සහ Total Fire Ban Days (සම්පූර්ණ ගිනි තහනම්) ඇති අවස්ථාවල ගින්දර නීති විරෝධීව පත්තු කිරීම සම්බන්ධයෙන් ඇති දඬුවම විශාල දඩ සහ සිර දඬුවම් විය හැකිය.

| මා විසින් කල හැකි හෝ නොහැකි දේ මොනවාද? | | Fire Danger Periods (ගිනි අනතුරු කාල) වලදී | | Total Fire Ban (සම්පූර්ණ ගිනි තහනම්) වලදී |
|---|---|---|---|---|
| **බාබෙකිව් දැමීම (barbecue), කඳවුරු ගිනි ඇති කිරීම (light a campfire) හෝ උණුසුම හෝ පහසුව තකා ගිනි දැල්වීම මා හට කල හැකිද?**<br> | ඔව් | **පහත කරුණු ඇතිනම් පමණි:**<br>☑ සුළඟේ වේගය පැයට කිමී. 10 ට වඩා වැඩි නොමැති විය යුතුය<br>☑ ගිනි දල්වන්නේ **නිසි ලෙස ගොඩනගන ලද** ගිනි ස්ථානයක (fireplace) නම්: අවම වශයෙන් සෙ.මී. 30 ක් වත් ගැඹුරු වළක විය යුතුය<br>☑ බාබෙකිව් උපකරණය වටා මීටර 3 ක ප්‍රදේශයක් ගිනි ගන්නා සුළු දේවලින් තොර විය යුතුය<br>☑ ගින්න වර්ග මීටර 1 කට වඩා ප්‍රදේශයක් පුරා නොවිය යුතුය භාවිතා කරන ඝණ දැව අවශ්‍ය අවම ප්‍රමාණය විය යුතුය<br>☑ ගින්දර දල්වා ඇති සෑම විටම ගින්න නිවීමට හැකියාව ඇති අයෙකු සිටිය යුතුය<br>☑ එම අය එම ස්ථානයෙන් යාමට පෙර ගින්න සම්පූර්ණයෙන්ම නිවා දැමිය යුතුය<br>CFA පනතට අනුව නිසි ලෙස ගොඩනගන ලද ගිනි ස්ථානයක් යනුවෙන් අදහස් වන්නේ, ගින්නෙහි වට ප්‍රමාණය සීමා කල හැකි ආකාරයට ගලින්, යකඩ මගින්, කොන්ක්‍රීට් හෝ වෙන යම් ගිනි නොගන්නා දැයකින් ගොඩනගා ඇති ගිනි ස්ථානයකි.<br>වාණිජ වශයෙන් නිපදවන ලද බාබෙකිව් උපකරණයක් නිසි ලෙස ගොඩනගන ලද ගිනි ස්ථානයක් වශයෙන් සැලකේ. | ඔව්<br><br>නැත | **ස්ථිරව සවිකර ඇති බාබෙකිව් උපකරණ:**<br>☑ **ආහාර පිළියෙල කිරීම සඳහාම සැලසුම් කල ගල්, යකඩ, කොන්ක්‍රීට් හෝ වෙනත් ගිනි ගන්නේ නැති දෙයකින් සෑදූ ගෑස් හෝ විදුලිය මගින් ගින්දර ලබා ගන්නා ස්ථිර ව්‍යුහ**<br>☑ **එසේ නැතිනම් ආහාර පිළියෙල කිරීම සඳහාම පමණක් වාණිජ වශයෙන් සැලසුම්කර නිෂ්පාදනය කල ගෑස් හෝ විදුලිය පමණක් භාවිතා කරන (එහා මෙහා ගෙනයා හැකි බාබෙකිව්) ගින්දර පත්තු කර ඇති අවස්ථාවේදී ස්ථිර ලෙස තබා ඇති පහත අවශ්‍යතා සපුරාලන උපකරණ:**<br>☑ බාබෙකිව් උපකරණයේ පිටත සිට මීටර 3ක් ඇතුලත ගිනි ගන්නා සුළුවූ ද්‍රව්‍යවලින් තොරවීම<br>☑ වතුර සැපයුමක් ඇති වතුර බටයක් හෝ අවම වශයෙන් පහත ආකාරයේ වාහනයක් තිබීම: ක්‍ෂණිකව භාවිතය සඳහා වතුර ලීටර 10ක් තිබීම<br>☑ ගින්දර පත්තුකර ඇති සෑම විටකම එම ගින්න නිවිය හැකි වැඩිහිටියෙකු සිටීම<br>☑ වැඩිහිටියා යාමට පෙර ගින්න සම්පූර්ණයෙන්ම නිවා දැමීම.<br>**Total Fire Ban Days (සම්පූර්ණ ගිනි තහනම් දිනවලදී) කැම්ප්ෆයර්, උණුසුමට හෝ පුද්ගලික පහසුව සඳහාවූ ගිනි තැබීම තහනම්වේ. ඝණ හෝ දියර මගින් ගින්දර ලබාදෙන බාබෙකිව් සහ උදුන්ද Total Fire Ban Days (සම්පූර්ණ ගිනි තහනම් දිනවලදී) තහනම්වේ.** |
| **මම ආහාර පිළියෙල කරන (කෑමබීම සපයන) ව්‍යාපාරයක් පවත්වාගෙන යන අයෙකු හෝ ප්‍රජා/පුණ්‍ය/මුදල් රැස්කරන සංවිධානයකි. එළිමහන් උත්සව සඳහා බාබෙකිව් හෝ ස්පිට් කිරීම සඳහා මා විසින් ගින්දර පත්තුකල හැකිද?**<br> | ඔව් | **පහත කරුණු ඇතිනම් පමණි:**<br>☑ සුළඟේ වේගය පැයට කිමී. 10 ට වඩා වැඩි නොමැති විය යුතුය<br>☑ ගිනි දල්වන්නේ **නිසි ලෙස ගොඩනගන ලද** ගිනි ස්ථානයක (fireplace) හේ වළක නම්: අවම වශයෙන් සෙ.මී. 30 ක් වත් ගැඹුරු වළක විය යුතුය<br>☑ උපකරණය වටා (බාබෙකිව් හෝ ස්පිට්) මීටර 3 ක ප්‍රදේශයක් ගිනි ගන්නා සුළු දේවලින් තොර විය යුතුය<br>☑ ගින්න වර්ග මීටර 1 කට වඩා ප්‍රදේශයක් පුරා නොවිය යුතු අතර භාවිතා කරන ඝණ දැව අවශ්‍ය අවම ප්‍රමාණය විය යුතුය<br>☑ ගින්දර දල්වා ඇති සෑම විටම ගින්න නිවීමට හැකියාව ඇති අයෙකු සිටිය යුතුය<br>☑ එම අය එම ස්ථානයෙන් යාමට පෙර ගින්න සම්පූර්ණයෙන්ම නිවා දැමිය යුතුය | ඔව් | **CFA හෝ MFB මගින් නිකුත් කල ලිඛිත අවසරයක් ඇතිනම් සහ ඔබ එම බලපත්‍රයේ ඇති කොන්දේසිවලට අනුව කටයුතු කරන්නේ නම් මෙය කල හැක.**<br>මුදල් රැස්කිරීම කරන ප්‍රජා සංවිධානයක්, හෝ පුණ්‍ය සංවිධානයක් (උදා. වශයෙන් මුදල් රැස්කරන පාසැලක්, හෝ ක්‍රීඩා කණ්ඩායමක්) සිය ව්‍යාපාර කටයුතු අතරතුරදී වෙනත් අය වෙනුවෙන් ආහාර පිළියෙල කිරීම සඳහා ගිනි පත්තු කිරීමට අවසර ඉල්ලා සිටිය හැකිය. මෙම බලපත්‍ර නිකුත් කරනුයේ ප්‍රාදේශීය CFA දිස්ත්‍රික් කාර්යාල, CFA මූලස්ථානය හෝ MFB කලාප කාර්යාල වල ඔවුමන්ගේ අභිමතය අනුවවේ.<br>නගර සභා ගිනි නිවාරණ නිලධාරීන් හට මෙම බලපත්‍ර නිකුත් කල නොහැකිය. |

# මා විසින් කල හැකි හෝ නොහැකි දේ මොනවාද?

2012 යාවත්කාලීන කරන ලදී

| මා විසින් කල හැකි හෝ නොහැකි දේ මොනවාද? | | Fire Danger Periods (ගිනි අනතුරු කාල) වලදී | | Total Fire Ban (සම්පූර්ණ ගිනි තහනම්) වලදී |
|---|---|---|---|---|
| **තණකොළ, ඉපනැල්ල, වල් ගස්, යටි ගොන්න හෝ වෙනත් ගහකොළ පිළිස්සීමට විවෘත ප්‍රදේශයක ගින්නක් ඇති කිරීමට මට හැකිද?**<br> | ඔව් | **පහත කරුණු ඇතිනම් පමණි:**<br>☑ රජයේ අධිකාරිය ඇති ගිනි නිවාරණ නිලධාරියෙකු, නගර සභා ගිනි නිවාරණ නිලධාරී හෝ CFA දිස්ත්‍රික් කාර්යාලයක් මගින් නිකුත් කල ලිඛිත අවසර පත්‍රයක් ඔබ හට තිබිය යුතුය<br>☑ ඔබ එම බලපත්‍රයේ ඇති කොන්දේසිවලට අනුව කටයුතු කරයි නම්<br>☑ ගින්දර දල්වා ඇති සෑම විටම ගින්න නිවීමට හැකියාව ඇති අයෙකු සිටිය යුතුය<br>☑ එම අය එම ස්ථානයෙන් යාමට පෙර ගින්න සම්පූර්ණයෙන්ම නිවා දැමිය යුතුය<br>බොහෝ නගර සභා මගින් මිදුම සම්බන්ධ අනතුරු හැඟවීම් ඇති දිනවල සිය නගර සභා බල ප්‍රදේශවල නියමිත ස්ථානවල හෝ නියමිත වේලාවල පිලිස්සීම තහනම් කරඇත. කරුණාකර නගර සභා ගිනි නිවාරණ නිලධාරීගෙන් විමසා දැනගන්න. | නැත | Total Fire Ban Days (සම්පූර්ණ ගිනි තහනම් දිනවලදී) දිනවල විවෘත තැන්වල තණකොළ, අකුල්, ඉපනැල්ල හෝ කුණු කසළ විවෘත ප්‍රදේශවල පිළිස්සීම තහනම්වේ.<br>ඕනෑම Total Fire Ban Days (සම්පූර්ණ ගිනි තහනම් දිනවලදී) දිනවල නගර සභා ගිනි නිවාරණ නිලධාරීන් විසින් නිකුත් කර ඇති ඕනෑම බලපත්‍රයක් අත්හිටවනු ඇත. |
| **හෝග, තණකොළ, ඉපනැල්ල, වල් ගස්, යටි ගොන්න හෝ වෙනත් ගහකොළ හා සම්බන්ධයක් ඇති තැන්වල වාහනයක් පැදවීමට මට හැකිද?**<br> | ඔව් | **එසේ කල හැකි වන්නේ වාහනය නිහඬ කරන මෆ්ලරයක් වැනි කාර්යක්ෂම උපකරණයක් (efficient silencing device) ඔබගේ වාහනයට සවිකර ඇති අතර ඒ මගින් එංජිමේ ඇති සියළුම අපද්‍රව්‍ය ඉවත් කරන්නේ නම් පමණි.**<br>Total Fire Ban Days (සම්පූර්ණ ගිනි තහනම් දිනවලදී) නොමැති අවස්ථාවක වුවද, වාහනවලින් පිට කරන උණුසුම් ද්‍රව්‍ය මගින් ඇතිවිය හැකි අවදානම හේතුවෙන් උණුසුම් සහ වියළි තත්වයන් යටතේ වියළි ගහකොළ ඇති තැන්වල වාහන පැදවීමෙන් වැළකී සිටිය යුතුය. | ඔව් | **එසේ කල හැකි වන්නේ වාහනය නිහඬ කරන මෆ්ලරයක් වැනි කාර්යක්ෂම උපකරණයක් (efficient silencing device) ඔබගේ වාහනයට සවිකර ඇති අතර ඒ මගින් එංජිමේ ඇති සියළුම අපද්‍රව්‍ය ඉවත් කරන්නේ නම් පමණි.**<br>වියළි ගහකොළ සහ වාහනවලින් පිට කරන උණුසුම් ද්‍රව්‍ය මගින් ඇතිවිය හැකි දැඩි ගිනි අවදානම හේතුවෙන් හැකි සෑම විටම මෙයින් වැළකී සිටිය යුතුය. |
| **මා හට දම්වැල් කියතක් (Chainsaw), ගස් හෝ තණකොල අඩු කරන යන්ත්‍රයක් (plant or grass trimmers) හෝ තණකොළ කපන යන්ත්‍රයක් (lawn mowers) පාවිච්චි කිරීම මා හට කල හැකිද?**<br>  | ඔව් | **දම්වැල් කියතක් (Chainsaw), ගස් හෝ තණකොල අඩු කරන යන්ත්‍රයක් (plant or grass trimmers) හෝ තණකොළ කපන යන්ත්‍රයක් (lawn mowers) සීමාවක් නොමැතිව *කොළ පැහැ ගස් මත භාවිතා කල හැක.***<br>නමුත් *කොළ පැහැ* ***නොමැති*** *ගස්කොළ* මත දම්වැල් කියතක් (Chainsaw), ගස් හෝ තණකොල අඩු කරන යන්ත්‍රයක් (plant or grass trimmers) හෝ තණකොළ කපන යන්ත්‍රයක් (lawn mowers) භාවිතා කිරීම සඳහා පහත ආකාරයට කටයුතු කල යුතුය:<br>☑ ගින්නක් ඇතිවිය හැකි දෝෂ හෝ යාන්ත්‍රික දෝෂවලින් තොරනම්<br>☑ කාර්යක්ෂම ගිනි පුපුරු මැඩපවත්වන උපකරණයක් (spark arrester) සවිකර ඇතිනම්<br>☑ යන්ත්‍රය අවට මීටර 3 ක ප්‍රදේශයක් ගිනි ඇවිලෙන සුළු ද්‍රව්‍යයන්ගෙන් තොරවීම<br>යන්ත්‍රය ක්‍රියා කරන අය යන්ත්‍රය ක්‍රියාත්මක කරන සෑම අවස්ථාවකම ළඟ සිටිය යුතු අතර පහත ඇති ගිනි නිවන උපකරණවලින් එකක් හෝ ළඟ තබා ගත යුතුය:<br>› වැඩ කරන තත්වයේ ඇති සම්පූර්ණයෙන් වතුරින් පිරවූ අවම වශයෙන් ලීටර 9ක ධාරිතාවය ඇති නැප්සැක් ස්ප්‍රේ පොම්පයක්<br>› වැඩ කරන තත්වයේ ඇති වතුරින් ක්‍රියා කරන ගිනි නිවන උපකරණයක්. මෙය සම්පූර්ණයෙන් වතුරින් පුරවා තිබිය යුතු අතර නියමිත පීඩනයේ පවත්වාගත යුතුය. අවම වශයෙන් ලීටර 9ක ධාරිතාවයක් තිබිය යුතුය.<br>ඉහතින් දැක්වූ ගිනි පුපුරු මැඩපවත්වන උපකරණයක් (spark arrester), නැප්සැක් ස්ප්‍රේ පොම්පය සහ වතුරින් ක්‍රියා කරන ගිනි නිවන උපකරණය අදාල ඕස්ට්‍රේලියානු සම්මතයන්ට අනුකූල විය යුතුය. | ඔව් | **Fire Danger Period (ගිනි අනතුරු කාලය සඳහා).**<br>කෙසේවුවද හැකි සෑම විටම මෙම වැඩ කල් දමන්න. |

# මා විසින් කල හැකි හෝ නොහැකි දේ මොනවාද?

2012 යාවත්කාලීන කරන ලදී

| මා විසින් කල හැකි හෝ නොහැකි දේ මොනවාද? | | Fire Danger Periods (ගිනි අනතුරු කාල) වලදී | | Total Fire Ban (සම්පූර්ණ ගිනි තහනම්) වලදී |
|---|---|---|---|---|
| පහත සඳහන් කටයුතු මාවිසින් කල හැකිද:<br>› වැද්දුම් කිරීම, ඇඹරීම දැවීම්, පැස්සීම ගෑස් මගින් කැපීම<br>› මීමැස්සන් නැවත යැවීම<br>› මීපැණි ගැනීම<br>› දුම්රිය නඩත්තු<br>› තාර උණු කිරීම?<br> | ඔව් | පහත කරුණු ඇතිනම් පමණි:<br>☑ ගිනි පුපුරු, උණු යකඩ හෝ ලෝහ බොර ආදිය නැවැත්වීමට ගිනි ප්‍රතිරෝධී පළිහක් තිබිය යුතුය<br>☑ අවට මීටර 1.5 ක ප්‍රදේශයක් ගිනි ඇවිලෙන සුළු ද්‍රව්‍යයන්ගෙන් තොරවීම හෝ ගින්නක් පැතිරීම වැළැක්වීමට ප්‍රමාණවත් ලෙස තෙත් කර තිබීම<br>☑ ඔබ සතුව ජල සැපයුමක් හෝ අවම වශයෙන් වතුර ලීටර 9 ක් සහිත ජල විදින නැප්සැක් (water spray knapsack) යන්ත්‍රයක් තිබීම<br>☑ සියළු කපන ද්‍රව්‍ය සහ උණුසුම් ද්‍රව්‍ය ගිනි ප්‍රතිරෝධී උපකරණයක (fire-proof receptacle) බහාලිය යුතුය<br>☑ ගින්දර දල්වා ඇති සෑම විටම ගින්න නිවීමට හැකියාව ඇති අයෙකු සිටිය යුතුය<br>☑ එම අය එම ස්ථානයෙන් යාමට පෙර ගින්න සම්පූර්ණයෙන්ම නිවා දැමිය යුතුය | නැත | පහත ආකාරයේ කටයුතු:<br>› වැද්දුම් කිරීම, ඇඹරීම, පැස්සීම හෝ ගෑස් මගින් කැපීම<br>› මීමැස්සන් නවත යැවීම<br>› මීපැණි ගැනීම<br>› දුම්රිය නඩත්තු<br>› තාර උණු කිරීම<br>Total Fire Ban Days (සම්පූර්ණ ගිනි තහනම් දිනවලදී) අදාල විශේෂ බලපත්‍රයක් නොමැතිව කිරීම තහනම්වේ. මේවා 40 වගන්තිය යටතේ බලපත්‍ර ලෙස හැඳින්වේ.<br>සීමිත අවස්ථාවලදී CFA හෝ MFB මගින Total Fire Ban Days (සම්පූර්ණ ගිනි තහනම් දිනවලදී) පහත අයහට බලපත්‍ර ලබාදේ:<br>☑ ප්‍රජා සංවිධාන, පුණ්‍ය සංවිධාන, මුදල් රැස්කරන සංවිධාන<br>☑ ව්‍යවස්ථාපිත සංස්ථා,නගර සභා<br>☑ සිය රාජකාරී කිරීමට, මහජනතාව විනෝද කිරීමට, ආගමික හෝ සංස්කෘතික අරමුණු වෙනුවෙන් කාර්මික හෝ වෙළඳ ආයතනවලට<br>සිය කටයුතු කරගෙන යාම හෝ මහජනතාව සතුටු කිරීමට හෝ ආගමික හෝ සංස්කෘතික අරමුණු වෙනුවෙන් බලපත්‍ර ලබාදිය හැකිය.<br>මෙම බලපත්‍ර CFA දිස්ත්‍රික් කාර්යාල, CFA මූලස්ථානය හෝ MFB කලාප කාර්යාල මගින් නිකුත්කලයුතු වන අතර නගර සභා ගිනි නිවාරණ නිලධාරීන් විසින් නිකුත් කල නොහැක. |
| භශ්මකයක් (incinerator) භාවිතා කිරීම මා හට කල හැකිද?<br> | ඔව් | පහත අවශ්‍යතා සපුරා ඇතිනම්:<br>1. භශ්මක භාවිතා කිරීම සම්බන්ධයෙන් පනවන ලද කොන්දේසි හෝ සීමා කරන ප්‍රාදේශීය නීති ඇතිද යන්න නගර සභාව වෙතින් විමසා දැනගන්න (උදා. මීදුම ඇති බවට අනතුරු හඟවා ඇති දිනවල (smog alert days) ඇති නිශ්චිත දිනවල නිශ්චිත ප්‍රදේශවල සහ නිශ්චිත වේලාවල ඇති තහනම්)<br>2. තවද පහත අවශ්‍යතාද සපුරාලිය යුතුය:<br>☑ භශ්මකය තුල කාර්යක්ෂම ලෙස ගින්න සීමා කර ඇති විට<br>☑ වාතයේ වේගය පැයට කිමී 10 හෝ අඩු විය යුතුය<br>☑ භශ්මකය අවට මීටර 3 ක ප්‍රදේශයක් ගිනි ඇවිලෙන සුළු ද්‍රව්‍යයන්ගෙන් තොරවීම<br>☑ ගිනි දල්වා ඇති විට ගින් නිවීමට ප්‍රමාණවත් ජල සැපයුමක් තිබීම<br>☑ ගින්දර දල්වා ඇති සෑම විටම ගින්න නිවීමට හැකියාව ඇති අයෙකු සිටිය යුතුය<br>☑ එම අය එම ස්ථානයෙන් යාමට පෙර ගින්න සම්පූර්ණයෙන්ම නිවා දැමිය යුතුය | නැත | Total Fire Ban Days (සම්පූර්ණ ගිනි තහනම දිනවලදී) භශ්මක භාවිතය තහනම්ය. |

# මා විසින් කල හැකි හෝ නොහැකි දේ මොනවාද?

2012 යාවත්කාලීන කරන ලදී

| මා විසින් කල හැකි හෝ නොහැකි දේ මොනවාද? | | Fire Danger Periods (ගිනි අනතුරු කාල) වලදී | | Total Fire Ban (සම්පූර්ණ ගිනි තහනම්) වලදී |
|---|---|---|---|---|
| **හෝග, තණකොළ, ඉපනැලි, සල් පැළ, භූගත හෝග හෝ වෙනත් වගාවන් ඇති ප්‍රදේශයක සිට මීටර 9ක් ඇතුලත මවිසින් ගොවිපළ උපකරණයක් (Self-propelled farm machinery) ට්‍රැක්ටරයක්, ස්ලෑෂරයක්, පස් ඉවත් කරන, හාරන හෝ පාරවල් හදන යන්ත්‍රයක් භාවිතා කල හැකිද?**<br> | ඔව් | **හැකි වන්නේ අදාල යන්ත්‍රවල පහත අවශ්‍යතා ඇතිනම් පමණි:**<br>☑ ගින්නක් ඇතිවිය හැකි දෝෂ හෝ යාන්ත්‍රික දෝෂවලින් තොරනම්<br>☑ ක්‍රියා කරන ගිනි පුපුරු මැඩපවත්වන උපකරණයක් (spark arrester) (turbocharger හෝ exhaust aspirated air cleaner සවිකර නැති අවස්ථාවල) සවිකර තිබිය යුතුය.<br>☑ පහත දේ ඇතුලත් ගිනි නිවාරණ උපකරණයක් තබා ගත යුතුය:<br>› වැඩ කරන තත්වයේ ඇති සම්පූර්ණයෙන් වතුරින් පිරවූ අවම වශයෙන් ලීටර 9ක ධාරිතාවය ඇති නැප්සැක් ස්ප්‍රේ පොම්පයක්<br>› වැඩ කරන තත්වයේ ඇති වතුරින් ක්‍රියා කරන ගිනි නිවන උපකරණයක්. මෙය සම්පූර්ණයෙන් වතුරින් පුරවා තිබිය යුතු අතර නියමිත පීඩනයේ පවත්වාගත යුතුය. අවම වශයෙන් ලීටර 9ක ධාරිතාවයක් තිබිය යුතුය.<br>ඉහතින් දැක්වූ ගිනි පුපුරු මැඩපවත්වන උපකරණයක් (spark arrester), නැප්සැක් ස්ප්‍රේ පොම්පය සහ වතුරින් ක්‍රියා කරන ගිනි නිවන උපකරණය අදාල ඕස්ට්‍රේලියානු සම්මතයන්ට අනුකූල විය යුතුය. | ඔව් | **ගිනි අනතුරු කාලය (Fire Danger Period) සඳහා.**<br>කෙසේවුවද හැකි සෑම විටම මෙම වැඩ කල් දමන්න. හේතුව වන්නේ මේ මගින් ගින්නක් ඇතිවීමේ ඉඩකඩ ඉතා ඉහල බැවිනි. |

**බලපත්‍රයක් සදහා අයදුම්කල හැක්කේ කෙසේද?**

cfa.vic.gov.au වෙබ් අඩවිය ඔස්සේ අයදුම්පත්‍රයක් ලබාගත හැක. ඔබට ඔබගේ පළාතේ CFA දිස්ත්‍රික් මූලස්ථානය හා සම්බන්ධවී ඔබ වෙත තැපෑලේ අයදුම්පත්‍රයක් එවන ලෙස ඉල්ලා සිටිය හැකිය. CFA දිස්ත්‍රික් මූලස්ථානය හා සම්බන්ධවීම සඳහාවූ දුරකථන අංක ලැයිස්තුවක් වෙබ් අඩවියෙන් ලබාගත හැකිය. නැතිනම් දුරකථන අංක **(03) 9262 8444** ඔස්සේ ඉල්ලා සිටිය හැකිය.

මෙට්‍රොපොලිටන් ගිනි දිස්ත්‍රික්කය තුල බලපත්‍රයක් අවශ්‍යනම්, දුරකථන අංක **(03) 9662 2311** ඔස්සේ MFB ඇමතිය හැකිය නැතිනම් mfb.vic.gov.au වෙබ් අඩවිය වෙත යන්න.

**ලැව්ගිනි හෝ සැලසුම්කල පුළුස්සා දැමීම් සම්බන්ධ තොරතුරු ලබා ගන්නේ කෙසේද?**

දුරකථන අංක **1800 240 667** ඔස්සේ Victorian Bushfire Information Line අමතන්න නැතිනම් දුරකථන අංක **1800 555 677** ඔස්සේ National Relay Service (ජාතික රිලේ සේවාව) අමතන්න.

**මාගේ දේපළේ ගිනි අවුලා වැඩිපුර ඇතිදේ පුළුස්සා දැමීමට සැලසුම් කර ඇත. හදිසි ආපදා සේවා වෙත දැනුම් දෙන්නේ කෙසේද?**

ගිනි අවුලා වැඩිපුර ඇතිදේ පුළුස්සා දැමීමට බලපත්‍රයක් CFA වෙතින් හෝ නගර සභා ගිනි නිවාරණ නිලධාරියෙකු විසින් නිකුත්කර ඇතිනම් Emergency Services Telecommunications Authority වෙත දුරකථන අංක **1800 668 511** ඔස්සේ කල්තියා දැනුම් දිය යුතුය.

**මා විසින් ගින්නක් වාර්තා කරන්නේ කෙසේද?**

ගින්නක් වාර්තා කිරීමට Triple Zero **(000)** අමතන්න.

ප්‍රකාශයට පත් කලේ CFA මගිනි